අඛණ්ඩවම 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

31 වැනි කාණ්ඩය 60 වැනි පත්‍රය පිටු 18 යි කොටස් 2 යි විජය ප්‍රකාශනයක් 2021 නොවැම්බර් මස 18 වැනිදා බ්‍රහස්පතින්දා අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk මිල රුපියල් 30.00යි



## අගමැති ජන්ම දිනය අද

10 වැනි පිටුව බලන්න



## වැරැදි දේට විරුද්ධ වෙනවා: ආණ්ඩුව ඇතුළේ රූකඩ වගේ ඉන්නේ නෑ

6 වැනි පිටුව බලන්න

### ඉල් පුන් පොහොය අදයි

ජිගච්ඡාපරමා රෝගා - සංඛාරපරමා දුඛා
ඒතං ඤත්වා යථාභූතං - නිබ්බාණං පරමා සුඛං

බඩගින්න සියලු රෝගයන්ට ප්‍රධානවේ. සංස්කාර සියලු දුක්වලට ප්‍රධාන වේ. නුවණැත්තෝ මේ කරුණු ඇති සැටියෙන් දැන නිවන් අවබෝධ කරති. නිවන් සැප සැම සැපයටම වඩා උතුම්ය.

ධම්ම පදයෙන්

මෛත්‍රී බෝධිසත්ත්වයන් විවරණ ලැබීම, ප්‍රථම ධර්ම දූත සැට නම ධර්ම ප්‍රචාරයෙහි යෙදවීම, තුන්බෑ ජටිලයන් දමනය කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ උරුවෙල් දනව්වට වැඩම කිරීම සහ පසුවස් පවාරණය, ඉල් පුර පොහොය දින සිදුවූ වැදගත් ශාසනික සිද්ධීන්ය.

නොවැම්බර් මස 18 වැනිදා බ්‍රහස්පතින්දා පෑ:ව: 12.00 ට පසළොස්වක ලබා 19 වැනිදා සිකුරාදා පෑ:ව: 12.47 ට ගෙවේ. බ්‍රහස්පතින්දා සිල්.

නිමල් ජයසේකර -ලංකාදීප ග්‍රැෆික්

# ඩොලර් හිඟය උග්‍රවෙයි

# මූල්‍ය අරමුදලට යනවාද?



# ආණ්ඩුව දෙගිඩියාවෙන්


(අජන්ත කුමාර අගලකඩ)

රට තුළ උග්‍ර වී ඇති ඩොලර් හිඟය මගහරවා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගොස් ණයක් ලබා ගන්නේදැයි යන්න සම්බන්ධයෙන් ආණ්ඩුව තුළ මත ගැටුමක් නිර්මාණය වී ඇතැයි රජයේ ආරංචි මාර්ග සඳහන් කරයි.

6 වැනි පිටුවට

# සඳහිරු සෑය සසුනට පිදීම අද

## පුණ්‍ය උළෙලට ජනපතිත්-අගමැතිත්




(ඡායාරූපය - දයාරත්න ඇඹෝගම)

(ඩයනා උදයංගනී සහ අනුරාධපුර-දයාරත්න ඇඹෝගම)

තිස් වසරක යුද්ධයේ දී දිවි පිදූ සහ ආබාධිත තත්වයට පත් රණවිරුවන්ට උපහාරයක් වශයෙන් අනුරාධපුර පූජා නගරයේ ඉදිකෙරුණු 'සඳ හිරු සෑය' සසුනට පූජා කිරීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අද (18) පස්වරුවේ සිදු කෙරේ.

6 වැනි පිටුවට

## සජබ රැලියෙන් කොවිඩ් රැල්ලක් ආවොත් විපක්ෂය වගකිව යුතුයි



(සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න)

සමගි ජන බලවේගය පැවැත්වූ ජන රැලිය නිසා කොවිඩ් රැල්ලක් පැමිණ, රට නැවත වසා දැමීමට සිදු වුවහොත් එහි වගකීම විපක්ෂය බාරගත යුතු යැයි මහජන ආරක්ෂක අමාත්‍ය, විශ්‍රාමික රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (17) පැවැසීය.

6 වැනි පිටුවට



## අදටත් දෙස් විදෙස් මතකය අතර රඟයි වජිරා 'පද්ම ශ්‍රී' පිදුමෙන් පිදුණු වගයි

ශ්‍රී ලංකාවේ නර්තන කලාව ජාත්‍යන්තරයට ගෙන ගිය අග්‍රගණ්‍ය නර්තන ශිල්පිනියක වන ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මියට ඉන්දීය රජයෙන් පිරිනැමුණු "පද්ම ශ්‍රී සම්මානය" ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා විසින් අරලියගහ මන්දිරයේ දී ඇයට පිළිගන්වනු ලැබූ අයුරු. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතාද මෙහි වෙති. (වාර්තාව 6 පිටුවේ)

## සජබ උද්ඝෝෂණයට ත්‍රස්ත ප්‍රහාරයක් වෙනවැයි බොරු කී සැකකරු රිමාන්ඩ්

10 වැනි පිටුව බලන්න

## පහළ කඩුගන්නාව වසා තිබූ කොටසේ මංතීරුවක් ඇරෙයි

## මනෝ ගනේෂන්ට කොරෝනා



6 වැනි පිටුව බලන්න

## දහම් පාසල් 28 ද ඇරේ

10 වැනි පිටුව බලන්න

පණ්කජ රුවින්දගේ

### සරදම



අයි.එම්.එෆ්. යන්න ඕනෑ නෑ කංසා වවලා සල්ලි හොයන්න පුළුවන් කියලා ඩයනා කියනවා!

අපරාදෙ මුදල් ඇමැති කරන්න තිබුණේ ඩයනා!

## ලොව බලගතු පර්යේෂක ලැයිස්තුවට මහාචාර්ය මෙත්තිකා



10 වැනි පිටුව බලන්න

## ඉන්දියාවෙන් ගෙනා කුණු අල කන්ටේනරයක් දඹුල්ලෙන් අල්ලයි



10 වැනි පිටුව බලන්න






අතිගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට
උණුසුම් සුභ පැතුම්



සෙන්දිල් තොන්ඩමාන්
උප සභාපති - ශ්‍රී ලංකා කම්කරු කොංග්‍රසය

# 'කොවිඩ්' එන්නතින් පසු අතුරු ආබාධ: ඕස්ට්‍රේලියානුවෝ වන්දි ඉල්ලති

**සිඩ්නි නුවරදීය (රොයිටර්)**

'කොවිඩ් 19' ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා ගැනීමෙන් පසු හටගන්නා සෞඛ්‍ය ගැටලු සඳහා වන්දි ලබා ගැනීමට, ඕස්ට්‍රේලියානුවන් දහස් ගණනක් ලියාපදිංචි වී සිටින බව එරට මාධ්‍ය වාර්තා කරයි.

ඕස්ට්‍රේලියානුවන්ට ලබා දෙන එන්නත්, හදිසි භාවිතයට සුදුසු යැයි නිර්දේශ කර ඇත්තේ, එරට ඖෂධ පාලන අධිකාරියයි. එන්නත ලබා ගැනීමෙන් පසු සෞඛ්‍ය ගැටලු ඇති නම්, අදාළ වෛද්‍ය වාර්තා සමඟ ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි බව ඖෂධ පාලන අධිකාරිය ඕස්ට්‍රේලියානුවන්ට දැනුම් දී ඇත.

ඒ අනුව, මේ වනවිට එන්නත් ලබා ගැනීමෙන් පසු මතුවුණු සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් පැමිණිලි 79,000 ක් ඖෂධ පාලන අධිකාරියට ලැබී ඇති බව ඕස්ට්‍රේලියානු මාධ්‍ය වාර්තා කර තිබේ. එයින්ද 10,000ක් ලියාපදිංචි වී සිටිති.

ඕස්ට්‍රේලියානු සෞඛ්‍ය අංශ මේවනවිට එන්නත් මාත්‍රා මිලියන 36.8 ක් එරට වැසියන්ට ලබා දී ඇති අතර, එන්නත් ලබා ගැනීමෙන් 9 දෙනකු මියගොස් ඇතැයි ද පැවැසෙයි. එන්නත ලබා ගැනිමෙන් පසු සෞඛ්‍ය ගැටලු මතුවූයේ යැයි පැමිණිලි කළ වැඩි දෙනා අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන් බව මාධ්‍ය වාර්තා පෙන්වා දෙයි.

ඕස්ට්‍රේලියානුවන්ට ප්‍රධාන වශයෙන් ලබා දෙන්නේ 'ෆයිසර්' සහ 'ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා' එන්නත්ය. 'ෆයිසර්' එන්නත් ලබාගත් 288 දෙනකුගේ හෘදයට හානි සිදුවී ඇති බවටත්, 'ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා' එන්නත ලබා ගත් 160 දෙනකු රුධිර කැටි ගැසීම් නිසා රෝගී වී ඇති බවටත් පැමිණිලි ලැබී තිබේ.

යම් කිසි ඕස්ට්‍රේලියානුවකුට එන්නත් ලබා ගැනීමෙන් පසු සෞඛ්‍ය ගැටලුවලට මුහුණ පෑමට සිදුවූයේ නම්, ඒ වෙනුවෙන් වන්දි ලෙස ඕස්ට්‍රේලියානු ඩොලර් 5,000 ක මුදලක් ලබා දෙන බව බලධාරීන් පවසා ඇත. ලැබෙන පැමිණිලි විමර්ශනයට විශේෂ වෛද්‍ය කමිටුවක් ද පත් කර ඇත. මෙතෙක් ලැබී ඇති පැමිණිලි ගණන අනුව ඕස්ට්‍රේලියානු රජයට ගෙවීමට සිදුවනු ඇතැයි පැවැසෙන මුළු වන්දි මුදල ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 50 ක් බව ද මාධ්‍ය වාර්තා පෙන්වා දෙයි.

මේ අතර, ඕස්ට්‍රේලියාවේ අවුරුදු 12ට අඩු ළමයින්ටද ලබන ජනවාරි මාසයේ සිට එන්නත් ලබාදීමට පියවර ගන්නා බව එරට සෞඛ්‍ය අමාත්‍ය ග්‍රෙග් හන්ට් මාධ්‍ය හමුවේ පවසා ඇත. මේ වනවිට අවුරුදු 12 ට වැඩි ඕස්ට්‍රේලියානුවන් සැමට එන්නත් ලබා දීම සිදුවෙයි. එන්නත් ලබා නොගන්නා අය පමණක් ලොක්ඩවුන් තහංචි යටතේ නිවෙස්වලට කොටු කිරීමට පියවර ගන්නා බව ද ඕස්ට්‍රේලියානු රජය පවසා ඇත. මේ වනවිට වයස අවුරුදු 16ට වැඩි ඕස්ට්‍රේලියානුවන්ගෙන් සියයට 90 කට මේ වනවිට එක් කොරෝනා එන්නතක් හෝ ලබා දී ඇති අතර, එන්නත් මාත්‍රා දෙකම ලැබූ ගණන සියයට 83 කි.



# සරණාගතයෝ 50,000ක් ඇමෙරිකා කඳවුරුවල

**වොෂින්ටනයේදීය (ඒ.එෆ්.පී.)**

ඇමෙරිකා හමුදා ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් වෙද්දී, ඔවුන් සමඟ එරටින් පිටවුණු ඇෆ්ගන් සරණාගතයන් 50,000 ක පිරිසක් ඇමෙරිකාවේ සරණාගත කඳවුරුවල ජීවත් වන බව විදෙස් මාධ්‍ය වාර්තා කරයි.

ඇෆ්ගන් සරණාගතයන් වෙනුවෙන් ඇමෙරිකාවේ ප්‍රාන්ත කීපයක සරණාගත කඳවුරු 8 ක් ස්ථාපිත කර ඇති බව ද මාධ්‍ය වාර්තා වැඩි දුරටත් කියා සිටී. කඳවුරුවල සිටින මෙම පිරිස් සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත් සීත කාලගුණයට මුහුණ දෙන ඔවුන් දැඩි අසීරුතා රැසකින් පීඩා විඳින බවත් මාධ්‍ය අනාවරණය කර තිබේ.

මෙම සරණාගතයන් 50,000 ට අයත් වන්නේ ඇෆ්ගනිස්තානයේ ඇමෙරිකන් හමුදාවලට සහාය දැක්වූ ඇෆ්ගන් වැසියන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ය.

# ලොව ධනවත්ම රට චීනය: ඇමෙරිකාව දෙවැනි තැනට

**වොෂින්ටනයේදීය (රොයිටර්)**

ශුද්ධ වත්කම ඇමෙරිකන් ඩොලර් ට්‍රිලියන 514 ට වඩා ඉහළ යැමත් සමඟ, ඇමෙරිකාව පරදා චීනය ලෝකයේ ධනවත්ම රට බවට පත් වී ඇතැයි විදෙස් මාධ්‍ය වාර්තා කරයි.

විදෙස් මාධ්‍ය මෙසේ වාර්තා කළේ සුප්‍රසිද්ධ 'මැකෙන්සි' ජාත්‍යන්තර සමාගම උපුටා දක්වමිනි. 'මැකෙන්සි' ජාත්‍යන්තර සමාගම, ප්‍රකට ව්‍යාපාරික උපදේශන සමාගමකි.

'මැකෙන්සි' සමාගම පෙන්නා දෙන්නේ, 'කොවිඩ් 19' වසංගතය හමුවේ වුවත්, ඉකුත් වසර දෙකක කාලය තුළ චීනයේ වත්කම් ප්‍රමාණය තුන් ගුණයකින් ඉහළ ගොස් ඇති බවය. 'කොවිඩ් 19' වසංගතය පාලනය කර ගනිමින්, ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට චීනය ගත් සියලු උත්සාහයන් සාර්ථක වීම මෙසේ ශුද්ධ වත්කම ඉහළ යැමට හේතුවක් වී ඇති බව ද 'මැකෙන්සි' සමාගම පැහැදිලි කර තිබේ.

# කොරෝනා පෙත්ත නිපදවන්න සංවර්ධනය වෙමින් පවතින රටවල් 95 ක් සමඟ ගිවිසුම්

## ඇමෙරිකාවේ 'ෆයිසර්' සමාගම කියයි

**වොෂින්ටනයේදීය (රොයිටර්)**



තමන් නිපදවූ 'කොවිඩ් 19' පෙත්ත, සංවර්ධනය වෙමින් පවතින රටවල් 95 ක් සමඟ එක්වී, නිෂ්පාදනය කිරීමටත් විකිණීමටත් අවසර ලබා දෙන බව ඇමෙරිකාවේ 'ෆයිසර්' සමාගම පවසයි.

'ෆයිසර්' සමාගම, මෙම බෙහෙත් පෙත්ත නිෂ්පාදනය සහ විකිණීම සම්බන්ධයෙන් ඊට අදාළ ගිවිසුම් අත්සන් කිරීම සිදු කර ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් 'මෙඩිසින්ස් පේටන්ට්' සමාගම සමඟ හවුල් වෙමිනි. ඒ අනුව ඉදිරියේ දී සංවර්ධනය වෙමින් පවතින රටවල ඖෂධ සමාගම් සමග එක් වී මෙම බෙහෙත් පෙති නිපදවීම සිදුවනු ඇත.

'ෆයිසර්' සමාගමේ මෙම 'කොවිඩ් 19' පෙත්ත හැඳින්වෙන්නේ 'පැක්ස්ලොවිඩ්' යන වෙළෙඳ නාමයෙනි. මෙතෙක් සම්පූර්ණ කළ සායනික පර්යේෂණවලදී 'පැක්ස්ලොවිඩ්' සාර්ථක පෙන්නුම් කර ඇත්තේ 'කොවිඩ් 19' ආසාදිතයන් කඩිනමින් සුවපත් කරමිනි.


'ෆයිසර්' සමාගම පවසන ආකාරයට වෛද්‍ය උපදෙස් අනුව, 'කොවිඩ් 19' ආසාදිතයන්ට නිවසේ සිට 'පැක්ස්ලොවිඩ්' භාවිතයට ගැනීම කළ හැකිය. ඖෂධය භාවිතයට ගැනීමෙන් රෝහල්ගතවීමට ඇති ඉඩකඩ ද අවහිර වන බව 'ෆයිසර්' සමාගම පවසයි.

'කොවිඩ් 19' ලොව පුරා ව්‍යාප්ත වෙද්දී, එය අඩපණ කිරීමට එන්නතක් සොයා ගැනීමේ තරගයක් පැවැත්වෙද්දී, මෙතෙක් නිපදවා ඇති, නිපදවමින් පවතින සහ පර්යේෂණ මට්ටමේ පවතින ඖෂධ කොරෝනා රෝගීන්ට ලබා දෙමින් ඔවුන් ඉක්මනින් සුවපත් කිරීමටත්, ඔවුන් මරණින් ගලවා ගැනීමටත් වෛද්‍ය පර්යේෂකයෝ උත්සහ ගත්හ. ඊට අමතරව, කොරෝනා ආසාදිතයන් සුවපත් කිරීමේ අරමුණින්, නව ඖෂධ නිෂ්පාදනයට ද ලොව ප්‍රධාන පෙළේ ඖෂධ සමාගම් යොමු විය.

එහි ප්‍රතිඵලයක් ලෙස, 'කොවිඩ් 19' වසංගතය ආරම්භ වී වසර දෙකක් පමණ ගතවෙද්දී, අදවනවිට විවිධාකාරයේ ඖෂධ වර්ග කොරෝනා රෝගීන් සඳහා නිර්මාණය වී ඇතැයි විදෙස් මාධ්‍ය පෙන්වා දෙයි. පෙති, කරල්, ඉන්හේලර් (ආඝ්‍රානක) සහ නේසල් ස්ප්‍රේ (නාසික දියර ඉසින) එම ඖෂධ අතර වෙයි. මේවා වෛද්‍ය උපදෙස් මත නිවසේ සිට ලබා ගැනීමට හැකි ලෙස නිපදවා ඇත. එසේ වුවත්, මේවා තවමත් පර්යේෂණ මට්ටමේ පවතින අතර, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය ලැබී නැත.

'ෆයිසර්' සමාගමේ 'පැක්ස්ලොවිඩ්' බෙහෙත් පෙත්ත ඇමෙරිකාවේ 'මර්ක්" නමැති ඖෂධ නිෂ්පාදන සමාගම නිපදවන වයිරසනාශක බෙහෙත් කරලක් වන 'මොල්නුපියවියර්' ඖෂධයට සමාන බව ද පැවැසෙයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ හෝ ඇමෙරිකානු ආහාර සහ ඖෂධ පාලන අධිකාරියේ හෝ අනුමැතිය ලැබී නැතත්, 'මොල්නුපියවියර්' හදිසි භාවිතයට සුදුසු යැයි බ්‍රිතාන්‍ය ඖෂධ පාලන අධිකාරිය නිර්දේශ කර තිබේ. ඊට අමතරව, තවත් රටවල් කීපයක් ද 'මොල්නුපියවියර්' මිලදී ගැනීමට සූදානමින් පසුවන බව ද වාර්තා වේ.






බුද්ධත්වය ලැබීමෙන් පසුව එළඹුණ පළමුවැනි වැසි සමය බරණැසෙහිම ගෙවා අවසන් කළ බුදුන් වහන්සේ, ඒ වන විට හැට නමක්ව සිටි අනුගාමික රහතන් වහන්සේලා අමතා, " ... මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස, බොහෝ දෙනාගේ යහපත පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ගේ දියුණුව පිණිස, යහපත පිණිස, සැප පිණිස, ගම් නියම් ගම්හි හැසිරෙන්න... මුල යහපත් වූ, මැද යහපත් වූ, අග යහපත් වූ... සියලු ආකාරයෙන් සම්පූර්ණ වූ පිරිසිදු ධර්මය දේශනා කරන්න ..." යනුවෙන් උපදෙස් දී පිටත් කොට යවා, උන්වහන්සේ ද ධර්මය දේශනා කරනු පිණිස උරුවෙල් දනව්වේ සේනානිගම කරා වැඩම කළ අවස්ථාව මෙම ඉල් මස පසළොස්වක දින සිහිපත් කරමු.

**" ධම්මං චරේ සුචරිතං - න නං දුච්චරිතං චරේ**
**ධම්ම චාරී සුඛං සේති - අස්මිං ලෝකේ පරම්හි ච "**

යහපත් දැහැමි මාර්ගය අනුගමනය කරන්න. දුශ්චරිත මාර්ගය අනුගමනය නො කරන්න. ධර්මානුකූලව ජීවත්වන පුද්ගලයා මෙලොව මෙන්ම ඊළඟ ලොවෙහි ද සතුටින් ජීවත් වෙයි.

- ධම්මපද: 169



මේ උතුම් සිතුවිල්ල ගෙන එන්නේ

Maliban®

යහගුණයෙන් තව තවත් ඉදිරියට


# එඩිතර ආණ්ඩුවක් කිව්වට රට වටේ යන අසූචි නැව නවත්වන්න බැරිවෙලා

## සජිත් ප්‍රේමදාස

(නිමල කොඩිතුවක්කු)

"එඩිතර නායකත්වය සහ දේශපාලන ස්ථාවරත්වය සහිත ආණ්ඩුව බවට පම්පෝරි ගැසුවත් මාසයකට ආසන්න කාලය රට වටේ කරක් ගසන අසූචි නැව නතර කිරීමටවත් රජයට හැකියාව නැතැයි" විපක්ෂ නායක සජිත් ප්‍රේමදස මහතා පැවැසීය.

"අසූචි නැවකටත් බය ආණ්ඩුව ජනතාව ආරක්ෂා කරන්නේ කෙසේදැයි 69 ලක්ෂය ඇතුළු සමස්ත ආණ්ඩුව තේරුම් ගත යුතුව ඇතැයි" ද විපක්ෂනායකවරයා සඳහන් කළේය.



විපක්ෂනායකවරයා පැමිණි අයකුට පක්ෂ සාමාජිකත්වය පිරිනැමූ අවස්ථාව. සමගි ජන බලවේගය සමග එක්වූ ආචාර්ය ධනවර්ධන ගුරුගේ මහතාද මෙහි සිටී.

ආචාර්ය ධනවර්ධන ගුරුගේ මහතා සමගි ජන බලවේගය සමග නිල වශයෙන් එක්වීම සහ සාමාජිකත්ව ප්‍රවර්ධන වැඩසටහනට ගුරුගේ නේචර් පාර්ක් හිදී සහභාගී වෙමින් ඔහු මේ බව පැවැසීය.

ප්‍රකට ව්‍යාපාරිකයකු, සමාජ සේවකයකු, වෘත්තීයවේදියකු වන ආචාර්ය ධනසිරි ගුරුගේ මහතා සමගි ජනබලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකත්වය, වෘත්තීයවේදී සංසදයේ සාමාජිකත්වය, බෞද්ධ ආගමික කටයුතු පිළිබඳව උපදේශකත්වය මෙන්ම විපක්ෂ නායක උපදේශක ධුරයකටද පත් කර සිටී.

ජනතාව බලාපොරොත්තු වූයේ තමන් ජීවත් කරන ශක්තිමත් අයවැයක් බවත් දී ඇත්තේ හිස් ලියැවිල්ලක් බවත් විපක්ෂ නායකවරයා එහිදී සඳහන් කළේය.

වර්තමාන මුදල් ඇමැතිවරයා සතුව 'ඇලඩින්ගේ පුදුම පහන' තිබෙන බවත්, ඔහු අරුම පුදුම අයවැයක් ගෙනෙන බවත් අයවැයට පෙර ආණ්ඩුවේ මැති-ඇමැතිවරුන් පැවැසූයේ යයි ද සජිත් ප්‍රේමදස මහතා පැවැසීය.

මුදල් ඇමැතිවරයාට මොළ හතක් ඇති බවත්, ඔහු ඉදිරිපත් කරන අය-වැය නිසා විපක්ෂයට කලන්තය හැදෙන බවත් ආණ්ඩුව පැවැසුවත් ඉදිරිපත්ව ඇත්තේ රටටම කලන්තය හැදෙන අය-වැය කැයිද විපක්ෂ නායකවරයා සඳහන් කළේය.

ජනතාවගේ ජීවන තත්ත්වය සංවර්ධිත රටවල ජනතාවගේ ජීවන තත්ත්වය තරමටම හොඳයි කියා අයවැය කතාවේදී ඇමැතිවරයා කීවද සත්‍ය තත්ත්වය එය නොවන බවත් ඔහු සඳහන් කළේය.

කුඩා දරුවන් මන්දපෝෂණයෙන් දුක් විඳින රටක, අධ්‍යාපනයට ඔන්ලයින් පහසුකම් නැතුව දරුවෝ සුසුම් හෙළන රටක, තුන් වේල වෙනුවට එකවේලක් කන්නවත් ආදයමක් නැති රටක අය-වැය කතාවෙන් සුරංගනා ලෝකයක් මවතැයි ද විපක්ෂ නායකවරයා පැවැසීය.

ඉතාම විශිෂ්ට ජාත්‍යන්තර සබඳතා සහ නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් තිබෙන බවට ආණ්ඩුව පුරසාරම් කීවද දවසෙන් දවස රටේ ජාතික සම්පත් තුට්ටු දෙකට විදේශයන්ට විකුණන බවද, විපක්ෂ නායක සජිත් ප්‍රේමදස මහතා සඳහන් කළේය.

රටේ සම්පත් ආරක්ෂා කරන බවට බොරු බේගල් ඇද බා බලයට පත් වූ ආණ්ඩුව කුණුකොල්ලයට රටේ සම්පත් විකිණීමට හොර රහසේ ගිවිසුම් ගසතැයි ද විපක්ෂනායකවරයා කීය.

නව තාක්ෂණය සමග කෘෂිකර්මාන්තයට අලුත් පණ දී ඇතැයි අයවැයෙන් කීවද ප්‍රමිතියකින් තොර පොහොර මෙරටට ගෙන්වා සමාගම් අභියස දණින් වැටී ඇත්තේ කවුද කියා රටම දන්නා බවත් විපක්ෂ නායකවරයා පැවැසීය.

රට වැටී ඇති අගාධයෙන් ගොඩ ගෙන රටත්, ජනතාවත් සුරක්ෂිතව ඉදිරියට ගෙන යාමේ අභියෝගය සමගි ජන බලවේගය භාර ගන්නා බවත්, විපක්ෂ නායක සජිත් ප්‍රේමදස මහතා එහිදී වැඩිදුරටත් කියා සිටියේය.

මේ අවස්ථාවට සමගි ජන බලවේගය මෙහෙයුම් ප්‍රධානී හරින් ප්‍රනාන්දු, පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය කාවින්ද ජයවර්ධන යන මහත්වරුන් ඇතුළු මහජන නියෝජිතයෝ එක්ව සිටියහ.

# කලාව - සාහිත්‍යය රටක දියුණුවේ ලකුණක්

## රදාවාන සේකර උද්‍යානය විවෘත කරමින් රාජ්‍ය ඇමැති නාලක ගොඩහේවා කියයි



රාජ්‍ය අමාත්‍ය නාලක ගොඩහේවා, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක මහත්වරුන් සේකර උද්‍යානය ජනතා අයිතියට පැවරීමේ සිහිවටන ඵලකය නිරාවරණය කළ අවස්ථාව



සේකර උද්‍යානය විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වූ කලාකරුවන් ඇතුළු ආරාධිතයන්ගෙන් කොටසක්

ඕනෑම රටකට, සමාජයකට දියුණුව සඳහා කලාව, සාහිත්‍යය ඉතාම වැදගත් වන්නේ යැයි නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍ය නාලක ගොඩහේවා මහතා රදාවානේදී ඉකුත්ද (9) සවස පැවැසීය.

මහගමසේකර, ප්‍රේමසිරි කේමදස, මාර්ටින් වික්‍රමසිංහ, කේ. ජයතිලක වැනි කලා ක්ෂේත්‍රයේ දැවැන්තයන් බිහිවීම රටේ වාසනාවක් බව ද රාජ්‍ය අමාත්‍යවරයා පැවැසුවේය.

රදාවාන තුංමංහන්දිය සේකර උද්‍යානය ජනතා අයිතියට පැවරීමේ අවස්ථාවට සහභාගි වෙමින් ගොඩහේවා මහතා එසේ කීවේය.

රාජ්‍ය අමාත්‍ය නාලක ගොඩහේවා, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක යන මහත්වරුන් මල් කලඹ තබා මහගමසේකර පිළිරුවට උපහාර දැක්වූහ. අනතුරුව සිහිවටන ඵලකය නිරාවරණය කිරීමෙන් අනතුරුව උත්සවයේ කටයුතු ආරම්භ විය.

රාජ්‍ය අමාත්‍යවරයා මෙසේද කීවේය.

"මහගම සේකර සූරීන්ට ප්‍රතිභා රැසක්ම තිබුණා. ලේඛනය, චිත්‍ර, ගීත රචනය, චිත්‍රපට අධ්‍යක්ෂණ යනාදී ක්ෂේත්‍ර රැසකම ඒ මහතාගේ හැකියාව විහිදී ගියා. මාර්ටින් වික්‍රමසිංහ, ප්‍රේමසිරි කේමදස, කේ. ජයතිලක වැනි කලාවේ දැවැන්තයන් අතර ඔහු සුවිශේෂ වන්නේ ඒ නිසයි.

'තුන්මංහන්දිය' චිත්‍රපටය නිසා රදාවාන මුළු රටේම ප්‍රසිද්ධියට පත්වුණා. දේශපාලන බේදයකින් තොරව මේ සඳහා මූලික වී කටයුතු කළ සියලු දෙනාම සිහිපත් කරනවා. මෙම උද්‍යානය මේ රටේ සියලු කලාකරුවන්ට උපහාරයක් වෙනවා.

රජයේ සියක් නගර සංවර්ධන වැඩසටහන යටතේ රදාවාන තුංමංහන්දිය අංගසම්පූර්ණ ලෙස සංවර්ධනය කිරීමට පියවර ගන්නවා. එමගින් ප්‍රදේශයට විශාල ආලෝකයක් ලැබේවි."

**සංගීත විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා:**

"මහගමසේකර, ඩබ්ලිව්.ඩී. අමරදේව හා පනීභාරත සූරීන් ජීවත්ව සිටියදී ඔවුන්ගෙන් ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමේ අවස්ථාව ලැබුණු සිසුවකු ලෙස මම අද විශාල සතුටට පත්වෙනවා.

එද මම සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සිසුවකු ලෙස සිටියදී සංගීත අංශය අමරදේව සූරීන් ද නර්තන අංශය පනීභාරත මහතා, චිත්‍ර හා මූර්ති අංශය මහගමසේකර මහතා මෙහෙයවනු ලැබුවා. මෙවැනි මහා කලාකරුවන්ගේ කටයුතු දෙස ශිෂ්‍යයකු ලෙස මා බලා සිටියා. මොවුන් තිදෙනා කතා කර කර සිටිනවා මා දෑසින් දැක්කා. ඒ අතින් මා ඉතා වාසනාවන්තයි. අමරදේව හා මහගමසේකර එකතුවෙලා රටට කළ සේවය කතා කරන්න කල්පයක් ගතවෙනවා.

ඔවුන් නොසිටියත් සිටිනවා වගේ දැනෙනවා. සේකර සූරීන්ගේ ගීතයකට අමරදේවයන්ගේ තනුවකට ගායනා කිරීමේ අවස්ථාව මට ලැබුණා.

'මා මළ පසු මේ සීතල මළකඳ
ඔබගේ තුරුලේ උණුසුම් කළ මැන
සුසුමින් සුසුමට
මා උණුසුම් කොට
මේ පොළොවෙම මා
යළි බිහි කළ මැන' එම ගීතයයි.

වත්මන් දරු පරපුරෙන් මා ඉල්ලා සිටින්නේ මේ දැවැන්තයින් තිදෙනා හඳුරන්න කියලයි."

ප්‍රවීණ ගීත රචක බන්දුල නානායක්කාරවසම්, උදිත වික්‍රමාරච්චි, කිව්ඳු ආරියරත්න යන මහත්වරු ද අදහස් දැක්වූහ.

දෙම්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන කාරියප්පෙරුම, ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජගත් අතුකෝරළ, රාජා ලක්ෂ්මන්, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විශ්‍රාමික මේජර් ජනරාල් උදය නානායක්කාර, දෙම්පේ ප්‍රාදේශීය ලේකම් නිශ්ශංක ආරච්චි, ගම්පහ ප්‍රාදේශීය ලේකම් සුරංගා ගුණතිලක යන මහත්ම මහත්මීහු සහ ප්‍රදේශයේ කලාකරුවන්, ප්‍රදේශවාසීන් ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

මෙදින සවස 7.00 සිට සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සිසුන් සහභාගි වූ සේකර සම්භාවනා සංගීතමය වැඩසටහන ද පැවැත්විණි.

(කිරිඳිවැල - උපාලි රණවීර)

# තාක්ෂණ උද්‍යාන බිම නිරීක්ෂණයට ආ අමාත්‍යාංශ ලේකම්ට ජනතා විරෝධය

(කුරුණෑගල - අජන්ත රත්නායක)

කුරුණෑගල, රත්ගල්ල ප්‍රදේශයේ ඉදිකෙරෙමින් පවතින තාක්ෂණ උද්‍යානයක් නිරීක්ෂණය කිරීමට පැමිණි තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ජයන්ත ද සිල්වා මහතාට ඊයේ 17 වැනිදා ප්‍රදේශවාසීන්ගෙන් දැඩි විරෝධයක් එල්ල විය.

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත්, හෙට්ටිවත්ත ක්‍රීඩා පිටිය නමැති අක්කර දෙක හමාරකින් යුත් ඉඩමක් මෙම තාක්ෂණ උද්‍යානය ඉදිකිරීමට යොදා ගැනීමට නියමිත බවත්, අදාළ ක්‍රීඩාපිටිය තමන්ගේ පොදු කටයුතු සඳහා තිබූ එකම ස්ථානය බවත් කියමින් ප්‍රදේශවාසීහු විරෝධතාවේ නිරත වූහ. අදාළ ඉදිකිරීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ට කරුණු පැහැදිලි කිරීමට උත්සාහ කිරීමේදී අමාත්‍යාංශ ලේකම්වරයා සහ ප්‍රදේශවාසීන් අතර උණුසුම් වචන හුවමාරුවක් ද සිදුවිය.

මෙහිදී කුරුණෑගල ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධර්මප්‍රිය දිසානායක මහතා (ජ.වි.පෙ) පැවසුවේ, මෙම ව්‍යාපෘතිය හේතුවෙන් මෙතෙක් කාලයක් ගමේ පොදු වැඩ සහ ක්‍රීඩා කටයුතු සඳහා භාවිත කළ ස්ථානය ගමට අහිමි වන බවය. මෙම ව්‍යාපෘතිය පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ ප්‍රාදේශීය සභාව කිසිවක් නොදන්නා බවත්, අඩුම තරමින් ග්‍රාම නිලධාරීවරයා හෝ මේ පිළිබඳව දැනුවත්ව නැතැයි ද හෙතෙම පැවසීය.

අදාළ ව්‍යාපෘතියේ කොටසක් ලෙස සමාජ ශාලාවක් ද ආරම්භ කිරීමේ සූදනමක් ඇති බවත්, විශ්වෝද විද්‍යාලය ඉදිරිපිට පිහිටා ඇති මෙම භූමියේ සමාජ ශාලාවක් ආරම්භ කිරීම කිසිසේත්ම අනුමත කළ නොහැකි බවත් ඔහු පැවැසීය. මෙම ව්‍යාපෘතිය රජයේ වටිනා ඉඩම් පෞද්ගලික අංශයට පැවරීමේ ක්‍රියාවලියේ තවත් දිගුවක් බව ද හෙතෙම වැඩිදුරටත් පැවැසීය.



අමාත්‍යාංශ ලේකම්වරයා හා ප්‍රදේශවාසීන් උණුසුම් කතාබහක යෙදුණු අයුරු.

මේ සම්බන්ධයෙන් තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ජයන්ත ද සිල්වා මහතා පැවසුවේ දිවයින පුරා තාක්ෂණ උද්‍යාන පහක් ඉදිකිරීමේ රජයේ වැඩපිළිවෙළ යටතේ මෙම ස්ථානයේ ද එක් තාක්ෂණ උද්‍යානයක් ඉදිකිරීම ආරම්භ කර ඇති බවය. එම ව්‍යාපෘතිය සඳහා රජය මගින් මෙම ඉඩම නම් කර ඇති බවත්, ඊට ප්‍රදේශවාසීන් විරෝධය දක්වන්නේ නම් ඒ පිළිබඳව විෂය භාර අමාත්‍යවරයා දැනුවත් කරන බවත් හෙතෙම පැවසීය.

අනතුරුව අමාත්‍යාංශ ලේකම්වරයා එම ස්ථානයෙන් පිට වී ගිය අතර, පැයක පමණ වේලාවක් විරෝධය දැක් වූ ප්‍රදේශවාසීහුද විසිර ගියහ.

# විශ්‍රාමික ගුවන් සෙබළා දුම්රියේ ගැටී මරුට

(වැල්ලවත්ත බී. ජානක)

වැල්ලවත්ත ප්‍රදේශයේ දී පෙරේද (16 වැනිදා) රාත්‍රී අටයි තිහට පමණ විශ්‍රාමික ගුවන් හමුදා සෙබළකු දුම්රියේ ගැටී ජීවිතක්ෂයට පත්ව ඇතැයි වැල්ලවත්ත පොලිසිය කියයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ, කුඩා වස්කඩුවේ පදිංචි සන්දරාදුර ප්‍රදීප් දිල්රුක් සිල්වා නමැති 42 හැවිරිදි තැනැත්තකු බව පොලිසිය කියයි.

වැල්ලවත්ත පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රශාත් සිල්වා මහතා, විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක රංගන ද සිල්වා, උප පොලිස් පරීක්ෂක දිසානායක, පොලිස් සැරයන් (36228) බණ්ඩාර යන නිලධාරීහු මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වති.

ගරු අග්‍රාමාත්‍ය මහින්ද මැතිතුමනි
චිරං ජයතු අභිත නායකයාණනි

ශ්‍රී ලාංකීය දේශයට මහා අභිමානයක්වූ
ශ්‍රී රෝහණ ජනරංජන
ගරු මහින්ද රාජපක්ෂ ශ්‍රී මතාණනි

ඔබට සුභම සුභ උපන්දිනයක්

ත්‍රිවිධ රත්නයේ නිරතුරු ආශීර්වාදයෙන් නිදුක් නීරෝගීව
දීර්ගායුෂ ලැබීමට නිබඳ වරම් ලැබේවා

U.H. අශෝක නාකුළුගමුව

## දිනය 16.11.2021 අඟහරුවාදා නිල ප්‍රතිඵල

www.nlb.lk

**මහජන සම්පත**

දිනුම් වාරය : 4588

දිනා ඇති මුළු මුදල රු. 9,207,920.00

ජයග්‍රාහී අක්ෂරය O — ජයග්‍රාහී අංක 3 9 8 0 2 0

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,623,605.00

**ගොවි සෙත**

දිනුම් වාරය : 2883

දිනා ඇති මුළු මුදල රු. 4,682,780.00

ඉංග්‍රීසි අක්ෂරය M — ජයග්‍රාහී අංක 18 36 56 67

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 70,784,834.40

**Mega Power මෙගා පවර්** — කෝටි 10

දිනුම් වාරය : 936

දිනා ඇති මුළු මුදල රු. 3,767,520.00

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 153,331,527.60

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

ඉංග්‍රීසි අකුර Q — සුපිරි අංකය 24 — ජයග්‍රාහී අංක 04 35 66 72

**ධන නිධානය**

දිනුම් වාරය : 618

දිනා ඇති මුළු මුදල රු. 3,598,100.00

ඉංග්‍රීසි අක්ෂරය V — ජයග්‍රාහී අංක 25 41 74 75

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 83,958,882.80

**සුපිරි වාසනා**

දිනුම් වාරය 1634 — දිනා ඇති මුළු මුදල රු. 4,469,504.40

සුපිරි අංකය 13 — ජයග්‍රාහී අංක 12 22 31 33

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 2,000,000.00

2021.11.16 ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකළ මුළු ත්‍යාගලාභීන් සංඛ්‍යාව 555,584

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල රු. 25,725,824.40

රු.2,384,164.40 ත්‍යාග : 01 — රු. 2,000,000.00 ත්‍යාග: 01

රු.1,000,000.00 ත්‍යාග: 02 — රු. 100,000.00 ත්‍යාග: 17

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board

අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.

දු.ක.: 011-4607000, 011 - 4607001 - 2
ෆැක්ස් : 011-4669475

ඉක්මන්වන්න! ඉතා වටිනා අවස්ථාවකි.!

සුපිරි තත්වයේ පාසැල් නිල ඇඳුම්

වෙළඳපොලේ අඩුම මිලට...

★ කොට කලිසම් සහ සුදුකමිස
★ දිග කලිසම් - (සුදු)
★ සුදු සහ කලු මේස් කුට්ටම්
★ ගැහැණු ළමුන්ගේ පෙටිකෝට් බැනියම්/ පැන්ටීස් වර්ග ළමා සාරි (සුදු) ආදී...

HIGH QUALITY SCHOOL UNIFORMS
ONLY FOR WHOLESALE DEALERS

පාසැල් ළමුන්ගේ සුපිරි නිල ඇඳුම් තොග වෙළෙඳුන්ට පමණයි.

DEAR

Piccaso

පර්ල් ටෙක්ස්ටයිල්
145 කේසර් වීදිය, කොළඹ-11
Tel: 011 2446836 | Fax: 011 2430295
E-mail: pearltexltd@gmail.com

උකස් රත්තරං

උකසින් බේරා වැඩිම මිලට මිලදී ගනිමි. ඉතිරි මුදල් ඔබේ අතට නැතහොත් නැවත වැඩිම මිලකට උකස් තබා දෙමි.

සංජීවනී:- 071-2318328

ESNA POWER GENERATORS

3kva - 4200kva

Rs. 95,000/= upwards.+ VAT

0768 232 305
0768 232 300

ceo@esnaallied.com
www.esnaallied.com

